## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය - 2018
-------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (අදාළ පරිදි) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 14 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් නිවාස ක්‍රම 02 කින් රු.මිලියන 1.08 ක ණය වාරික මුදල් අයකළද එම වත්කම් වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි. | සියලුම නිවාස ක්‍රම වලින් සමාලෝචිත වර්ෂයේ අය කල ණය වාරික මුදල් වල වටිනාකම අදාල පරිදි වත්කම් වල ගලපා මූල්‍ය තත්ව ප්‍රකාශන තුල දැක්වීමට කටයුතු කර ඇත. | ප්‍රමිතිය අනුව නිවාස ක්‍රමවල ප්‍රතිලාභ අධිකාරිය ලබන බැවින් මෙම නිවාස ක්‍රම අධිකාරියේ වත්කමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිරිවැය රු.මිලියන 36.49 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 4 කට අදාළව වාර්ෂික ක්ෂය ගණනය කර නොතිබුණු අතර එම වත්කම් මොනවාද යන්න හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | නිරවද්‍යව ක්ෂය ගිණුම්ගත කිරීම සඳහා කටයුතු කර ඇති අතර ඉදිරියේදී මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒ ඒ වත්කම් වල නව පොත් අගයන් ගිණුම්ගත කිරීමට බලාපොරොත්තු වේ. | අධිකාරිය සතු වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර එම වත්කම්වල ක්ෂය වියදම නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 1.1.3. (ii) පරිදි, අධිකාරිය විසින් ජංගම නොවන වත්කම් වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය කරන බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කිසිදු වත්කමක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මේ වන විටත් වත්කම් ප්‍රත්‍යාගණය කිරීම කෙරෙහි අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ගිණුම්කරණ ප්‍රතිපත්ති / ප්‍රමිත අනුව දේපළ පිරියත උපකරණ කාලීනව ප්‍රත්‍යාගණය කළ යුතුය. |

## 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුරාධපුර "තුරුඉතුරුගම හරිත ජනාවාස ව්‍යාපෘතියෙහි" නිවාසලාභින් 21 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ණය වාරික වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදි ලැබී තිබුණු ණය වාරික ආදායම වූ රු.361,700ක් පමණක් වෙනත් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය සඳහා 2015 දී ගිවිසුම් සංශෝධනය කිරීමට අධිකාරිය ගෙන ඇති තීරණයකට අනුව ක්‍රියාත්මක වූ ගිවිසුම් තවමත් අත්සන් කර නොමැති ප්‍රතිලාභීන්ගෙන් ලැබිය යුතු වාරික මුදල හඳුනා ගැනීමට පදනමක් නොමැති අතර එය ණය තොගය තුල ඇතුලත්ය. එමෙන්ම එම ණය වාරික ආදායම වෙනත් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල සටහන් කර නොමැත. | නිවාස ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් වලට එළඹිය යුතු අතර ගිවිසුම්වලට අනුව ලැබිය යුතු ණය වාරික මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් විසිරි නිවාස ණය වැඩසටහන යටතේ ලබාදුන් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු රු.33,071,556 ක් වෙනුවෙන් පමණක් රු.1,653,578 ක අඩමාණ ණය වෙන්කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.95,110,286 ක අනෙකුත් ණය ශේෂයන් වෙනුවෙන් අඩමාණ ණය වෙන්කර නොතිබුණි. එමෙන්ම එම ණය ශේෂ සඳහා අඩමාන ණය වෙන් කළ යුතු අකාරයද අධිකාරිය හඳුනාගෙන නොතිබුණි. | විසිරි ණය වැඩසටහන හැර අධිකාරිය මගින් ක්‍රියාත්මක කර ඇති අනෙකුත් ණය ව්‍යාපෘතීන් නිවාස ණය යෝජනා ක්‍රම වේ. අවසන් ණය වාරිකය ගෙවා නිම කරන තෙක් ම එම දේපළේ අයිතිය අධිකාරිය සතු වේ. එබැවින් විසිරි ණය සඳහා පමණක් අඩමාන ණය වෙන් කිරීම කර ඇත. | අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව ලැබිය යුතු මුළු ණය වෙනුවෙන් අඩමාන ණය වෙන් කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) | අනුරාධපුර තුරු ඉතුරුගම ප්‍රදේශයේ සුධාරක තාක්ෂණය යටතේ ඉදිකරන ලද නිවාස 09 ක සහ ඊට අදාළ ඉඩම්වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් සහ ගොඩනැගිලි යටතේ දැක්විය යුතු වුවත් එලෙස නොදැක්වීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම එම වටිනාකමින්ම ඌන ගණනය වී තිබුණි. | මීට අදාලව අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරියේ දී සිදු කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් තක්සේරුකර ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරිය කොන්ත්‍රාත්කරුවකුට ගෙවිය යුතු රු.444,382 ක් ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් එම අගයෙන්ම ඌන ගණනය වී තිබුණි. | මෙම කොන්ත්‍රාත්තුවට අදාලව නිම කරන වැඩ සම්බන්ධයෙන් අවසන් බිල් පත්‍රය සකස් කිරීම ප්‍රමාද වී සිදුව ඇති බැවින් ගෙවිය යුතු වටිනාකම හදුනාගත නොහැකි වීම හේතුවෙන් අදාළ වර්ෂයේ ගිණුම් ගත වී නොමැත. | ගෙවිය යුතු ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ දී අධිකාරිය විසින් අපහරණය කරන ලද මොටර් රථ 3 ක් සඳහා ලැබුණු රු. 5,423,025 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණු අතර එම මුදල අධිකාරියේ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ඌනතාවය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. | ව්‍යවස්ථාපිත ආයතන විසින් වත්කම් අපහරණයේ දී අනුගමනය කරන ගිණුම්කරණ ක්‍රියාවලිය තුල අපහරණයෙන් ලද ශුද්ධ ලාබය හෝ අලාභය හඳුනාගැනීම අවසානයේ දී සිදු කරයි. මීට අමතරව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සම්බන්ධයෙන් කල යුතු නිවැරදි කිරීම් විගණන උපදෙස් අනුව සිදු කිරීමට කටයුතු කරමි. | වත්කම් අපහරණය තුළින් ලද ශුද්ධ ලාභය/ අලාභය හඳුනාගෙන, එම අගය පමණක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය තුළ දැක්විය යුතුය. ඒකාබද්ධ අරමුදලට බැර කිරීම් අධිකාරියේ ස්කන්ධයට ගැළපිය යුතුය. |
| (ඊ) | නිවාස ව්‍යාපෘති 2 ක නිවාස 161 ක් පිරිවැයට වඩා අඩුවෙන් නිදහස් දීමනා පත්‍ර මත ලබා දීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදි භාණ්ඩාගාර ප්‍රදාන වලින් (Treasury Grant) රු.62,937,739 ක් ලියා හැර (write off) තිබුණු අතර මේ වෙනුවෙන් මහා භාණ්ඩාගාර අනුමැතියද ලබාගෙන නොතිබුණි. | අඟුලාන නිවාස ව්‍යාපෘතියේ කපා හැරීම සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීමට භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. රජගම ව්‍යාපෘතිය මගින් සුනාමි ව්‍යසනයට හසු වූ මූලික පවුල් 39ක් සඳහා නිවාස ආධාර ලෙස ලබා දීමට <u>අමාත්‍ය මණ්ඩල</u> අනුමැතිය 17/2s 7s/736/047 මගින් ලබා ගෙන ඇත. | මහා භාණ්ඩාගාර ප්‍රදාන මත ඉදිකරන ලද ඉදිකිරීම්වලට දරණ ලද පිරිවැය ලිය හැරීම සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |
| (උ) | ත්‍රිකුණාමලය නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් 2013 වර්ෂයෙහි අධිකාරියට ලැබුණු රු. මිලියන 25 ක භාණ්ඩාගාර ප්‍රදාන නැවත 2015 වසරේදි භාණ්ඩාගාරය වෙත නිදහස් කර තිබූ අතර ගිණුම් තැබීමේ දෝෂයක් නිසා එයින් රු. මිලයන 5 ක් අඟුලාන නිවාස ව්‍යාපෘති පිරිවැයෙන් අඩුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම නිවාස ව්‍යාපෘතියේ පිරිවැය එම වටිනාකමින්ම ඌන ගණනය වී තිබුණි. | ත්‍රිකුණාමල ව්‍යාපෘතියට අදාලව ලැබී තිබෙන රු.මි.25 නැවත 2015 දී නිදහස් කිරීමේ දී සිදුව ඇති සටහන් කිරීමේ දෝෂ හේතුවෙන් ඇතිව තිබෙන මෙම තත්වය ඉදිරි ගිණුම් තුල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මහා භාණ්ඩාගාර මගින් ලැබුණු ප්‍රදාන නැවත නිදහස් කිරීම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.5 අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16(3) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද 2018 වර්ෂය නිම වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ලබාදී නොතිබුණි. එසේම 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16 (ඉ) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අරමුදලට බැර කළ යුතුව තිබුණි. එසේ වුවත් 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා තිබුණු බැවින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සිය ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබුණි. | ආරම්භ ප්‍රාග්ධනය රු. මිලි 5,000 සහ බල රහිත කරන ලද දේපළ සංවර්ධනය කරන්නන්ගෙන් අය කරගනු ලැබූ සේවා ගාස්තුව නැවත අය කර ගැනීම සඳහා අමාත්‍යාංශ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.<br>සේවා ගාස්තුව නැවත බලාත්මක කිරීම සම්බන්ධව මෙතෙක් ඉදිරිපත් කරන ලද කැබිනට් මණ්ඩල පත්‍රිකා වලදී තීරණයක් ගෙන නොමැත. සේවා ගාස්තුව දැනට හිඟ හිටි රු. මිලි 207.00 ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය එකඟතාවය පල කල ද අධිකාරියේ වර්තමාන මූල්‍ය තත්ත්වය මත ගෙවීමට අපහසු බව ප්‍රකාශ කර ඇත. | පනතේ විධි විධාන අනුව මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර ආරම්භක ප්‍රාග්ධනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. අධිකාරියේ මුළු ආදායමින් සියයට 90 ක් රාජ්‍ය ප්‍රධාන වලින් ලැබෙන අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් මත උපයාගැනීම් සියයට 10 ක් පමණ වේ. මෙම තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විසිරි නිවාස ණය වැඩසටහනෙන් පළමු අදියර යටතේ ලැබිය යුතු ණය වාරික වටිනාකම රු.25,705,704 ක් වූ අතර එයින් අවුරුදු 1 සිට අවුරුදු 2 ත් අතර ශේෂය රු.6,363,755 ක් ද අවුරුදු 2 ට වැඩි ශේෂය 11,291,740 ක් ද විය. එමෙන්ම මෙම වැඩසටහනෙන් දෙවන අදියර යටතේ ලැබිය යුතු වාරික වටිනාකම රු.7,365,852 ක් වූ අතර එයින් අවුරුදු 1 - 2 ත් අතර ශේෂය රු. 2,119,094 ක්ද අවුරුදු 2 ට වැඩි ශේෂය රු.1,542,744 ක් ද විය. | අඩු ආදායම් ලාභීන් වෙනුවෙන් ක්‍රියාත්මක කල මෙම ණය වැඩසටහන යටතේ දැනට ගෙවීම් පැහැර හරින ප්‍රතිලාභීන්ට එරෙහිව නඩු පැවරීම ආරම්භ කර ඇත. | ණය වාරික අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල අඟුලාන නිවාස කුලී ආදායම රු.11,330,355 ක් වුවද වර්ෂය තුළදී අයකර ගත් කුලී ආදායම රු.923,537 ක් වූයෙන් අධිකාරිය අය කර නොගත් කුලී ආදායම, මුළු කුලී ආදායමෙන් සියයට 92 ක් විය. | අඟුලාන සයුර පුර මහල් නිවාස ණය ව්‍යාපෘතියේ ණය අය කිරීම් ප්‍රවර්ධනය කිරීම කෙරේ අවධානය යොමු කර ඇති අතර ණය නොගෙවන්නන්ට විරුද්ධව නීති ක්‍රියාමාර්ග ගැනීම කෙරේ ද අවධානය යොමු කර ඇත. | කුලී ආදායම රැස්කර ගැනීමට අදාළ පාලන ක්‍රම ශක්තිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ විකුණුම් සහ පුනස්ථාපන පදනම මත ලබා දුන් නිවාස 99 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,054,917 ක් ලැබිය යුතු වුවද ලැබුණු මුදල රු.1,047,338 ක් වුයෙන් අයනොකළ වාරිකවල වටිනාකම ලැබිය යුතු වාරික වටිනාකමින් සියයට 51 ක් විය. | තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ ණය ගිවිසුම් විධිමත් ව අත්සන් කර අවසන් කිරීම කෙරේ අවධානය මේ වන විට යොමු කර ඇති අතර ගිවිසුම් ප්‍රකාර ව කටයුතු නොකරන ප්‍රතිලාභීන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත. | ණය වාරික අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රඳවාගැනීම් (Retention) මුදල්වල එකතුව රු.1,299,416 ක් වූ අතර ඉන් රු.1,188,855 ක් වර්ෂ 1 ත් 5 ත් අතර පැවති අතර වර්ෂ 5 ඉක්මවූ ශේෂය රු.110,561 ක් විය. | අය වීම් ප්‍රවර්ධනය සඳහා අවධානය යොමු කරන අතර ණය අය කිරීම් කළමනාකරණය සඳහා වෙනම සේවක පිරිසක් යෙදවීමේ අවශ්‍යතාවය අත්‍යාවශ්‍යව පවතින බැවින් ඒ සම්බන්ධයෙන් නිසි අවධානය ඉදිරියේ දී යොමු කරමි. | රැඳවුම් මුදල් කාලීනව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු අතර තවදුරටත් නිදහස් කිරීමට වගකීමක් නොමැති ශේෂයන් හඳුනාගෙන ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට නිවාස ව්‍යාපෘති 02 ක හිඟ කුලී ආදායම රු.8,882,175 ක් වූ අතර ඉන් වර්ෂ 02 ත් 05 ත් අතර පැවැති ශේෂය 3,114,643 ක් වූ අතර වසර 5 ඉක්මවූ ශේෂය රු.3,194,859 ක් විය. එමෙන්ම විකුණුම් පදනම මත ලබාදුන් නිවාස ව්‍යාපෘති 03 ක හිඟ ණය වාරික වටිනාකම රු.33,353,705 ක් වූ අතර ඉන් වර්ෂ 02 ත් 05 ත් අතර පැවති ශේෂය රු.10,930,403 ක්ද අතර වසර 05 ඉක්මවූ ශේෂය රු.13,398,280 ක්ද විය | අය වීම් ප්‍රවර්ධනය සඳහා අවධානය යොමු කරන අතර ණය අය කිරීම් කළමනාකරණය සඳහා වෙනම සේවක පිරිසක් යෙදවීමේ අවශ්‍යතාවය අත්‍යාවශ්‍යව පවතින බැවින් ඒ සම්බන්ධයෙන් නිසි අවධානය ඉදිරියේ දී යොමු කරමි. | ණය වාරික සහ කුලී ආදායම අයකර ගැනීමට කඩිනම් හා ප්‍රමාණවත් පියවරක් ගත යුතුය. |

## 1.7 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත | නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබුණද, අධිකාරිය පිහිටුවා වර්ෂ 10 ක් ගතවුවද මෙකී ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරිමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. | උපදේශක කමිටුව විසින් කෙටුම්පත් කරන ලද ජනාවාස සංවර්ධනයට අදාලව ජාතික ප්‍රතිපත්තිය සඳහා කළමනාකරණය සෑහීමට පත් නොවීම මත අමාත්‍යාංශයේ ද මැදිහත් වීම ඇතිව අදාළ ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම සඳහා නව විද්වත් මණ්ඩලයක් පත් කිරීමට තීරණය කරන ලදී. | සංස්ථා පනතේ අරමුණුවලට අනුගත වී එම අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ 371 (2) (ආ) | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 77 කදී නිලධාරීන් 37 දෙනෙකු වෙත ලබාදී තිබූ රු.1,264,256 ක අතුරු අග්‍රිම පියවීමට දින 35 සිට දින 360 ක් දක්වා වූ කාලයක් ගතකර තිබුණි.<br>එමෙන්ම අත්තිකාරම් සීමාව ඉක්මවා අවස්ථා 14 කදී රු.3,610,000 අත්තිකාරම් ලබාදී තිබුණි. | වැඩසටහන් සඳහා කඩිනමින් දැරිය යුතු යැයි ඉහළ කළමනාකාරිත්වය අවස්ථානුකූල ව තීරණය කෙරෙන වියදම් සඳහා මෙසේ අත්තිකාරම් ලබා ගෙන ඇත. අත්තිකාරම ලබා දිය හැකි උපරිම සීමාවට අනුගත ව අවශ්‍ය අත්තිකාරම් ලබා දිය යුතු බවට මේ වන විට ඉහළ කළමනාකාරිත්වයේ අවධානය යොමු කර තිබේ. | මුදල් රෙගුලාසි අනුව ලබා දෙන අත්තිකාරම් වැඩ අවසන් වූ වහාම පියවා ගැනීමට කටයුතු කළ යුතු අතර අත්තිකාරම් සීමාවන් නොඉක්මවන පරිදි අත්තිකාරම් ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ii) මු.රෙ.770 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදි හඳුනාගත් අපහරණය කළ යුතු අයිතම 40 කට අයත් භාණ්ඩ 155 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ දක්වා අපහරණ කටයුතු සිදු කරන ලද්දේ පෙර සිට පැවති ආයතනික ක්‍රම වේදයකට වන අතර මින් ඉදිරියට මු.රෙ. 770 ප්‍රකාරව පොදු 47 ආකෘතියට අනුව සිදු කරන බව සඳහන් කරමි. | භාණ්ඩ අපහරණය මුදල් රෙගුලාසිවලට අනුකූලව සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 31,002,552 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.19,844,291 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 11,158,261 ක පිරිහීමක් නිරීක්ෂණය විය. කුලී වාහන වියදම වැඩිවීම හා ආපදා ණය වෙනුවෙන් ප්‍රතිපාදනයක් ඇති කිරීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වැටුප් වියදම් (කොන්ත්‍රාත් පදනම මත) සියයට 100 කින් ද ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තු වියදම් සියයට 240 කින් වෙනත් වියදම් (සැපයුම්) සියයට 280 කින් ද නීති වියදම් හා කල්බදු වාරික ගෙවීම් පිළිවෙලින් සියයට 155 හා 58 කින් ද වැඩි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 03 ක රජයේ ප්‍රදාන හැරුණු විට අධිකාරියේ ශුද්ධ වත්කම් සෘණ අගයක් ගෙන තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ශුද්ධ අලාභ අනුපාතය සියයට 273 කින් වැඩි වී තිබුණු අතර කුලී වාහන වියදම වැඩිවීම හා ආපදා ණය වෙනුවෙන් ප්‍රතිපාදනයක් ඇති කිරීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

## 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අධිකාරිය විසින් ඉදිකරන ලද හා ඉදිකරමින් පවතින නිවාස යෝජනා ක්‍රම 05 ක පවතින නිවාස ඒකක 863 කට අදාල හෙක්ටයාර 12.32 ක ඉඩම් විවිධ ආයතනවලින් පවරා ගැනීමට 2011 වර්ෂයේ සිට කටයුතු කළත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉඩම් පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි. එම හේතුවෙන් නිවාසලාභීන්ට ඉඩම් ඔප්පු ලබාදීමේ ප්‍රමාදයන් සිදුවන බව විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය. | රජයේ ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලියේ දී රජ්‍ය යාන්ත්‍රණයේ පවතින ප්‍රමාදය හේතුවෙන් නිවාස ව්‍යාපෘති 5 ක (අඟුලාන, සිංහපුර, වඳුලුසෙවණ, ලුනාව, තලවකැලේ) ඉඩම් පවරා ගැනීම් අවසන් කිරීමට නොහැකි වී ඇත. ඉඩම් පවරා ගැනීමේ දී අධිකාරිය විසින් ගත යුතු ක්‍රියාමාර්ග මේ වන තෙක් ක්‍රියාත්මක ඇති අතර, ඉඩම් අයත් ආයතන මඟින් සිදු කළ යුතු කාර්යයන්හි ප්‍රමාදයත් හේතුවෙන් ඉඩම් පවරා ගැනීම සම්පූර්ණයෙන් අවසන් කිරීමට නොහැකි වී ඇත.<br><br>අනුරාධපුර,හලාවත හා සහස්පුර ඉඩම් පවරා ගැනීම නිම කර ඇත. ඔප්පු ලබා දීම සඳහා බාධාවක් නොමැත. සහස්පුර ඔප්පු නිකුත් කරමින් පවතින අතර, අනුරාධපුර,හලාවත හා සහස්පුර ඇතැම් ප්‍රතිලාභීන් ගෙවීම් සිදුකර අවසන් නොමැති හෙයින් ඔප්පු නිකුත් කිරීම සිදු කළ නොහැකි වී ඇත. | නිවාස ලාභීන්ට එම නිවාස නීත්‍යානුකූලව පවරා දීම සඳහා ඉඩම් වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර ප්‍රදාන මගින් රු.මිලියන 1,172 ක් වැයකර ලුනාව නිවාස යෝජනා ක්‍රමය වෙනුවෙන් නිවාස ඒකක 380 ක් ඉදිකර තිබුණද 2012 මාර්තු 22 දින විෂයභාර අමාත්‍යවරයා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3 වන වගන්තිය පරිදි එම නිවාස වල පදිංචි කිරීමට මොරටුව මහ නගර සභා සීමාවේ පදිංචි අඩු පහසුකම් නාගරික ජනාවාස පවුල් 356 ක් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | පහත පරිදි ඉලක්ක කණ්ඩායම් 03 ක් නිවාස ඒකක 356 බැහැර කිරීම සඳහා හඳුනා ගෙන ඇති අතර ඒ සඳහා කෙටුම්පත් කරන ලද කැබිනට් පත්‍රිකාව අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.<br>• පුනස්ථාපන පදනම මත නිවාස ඒකක 56 -<br>• (ක්‍රීඩා හා කලා වැනි ක්ෂේත්‍රවලින් දස්කම් පෑ සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් - 32 | අමාත්‍ය මණ්ඩලය තීරණය අනුව නාගරික ජනාවාස පවුල් හඳුනා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | • රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු මධ්‍ය ආදායම් ප්‍රතිලාභීන් - 268 | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදි භාණ්ඩාගාර ප්‍රදාන මත අධිකාරිය විසින් ඉටු කිරීමට අපේක්ෂා කළ රු. මිලියන 1,270.08 ක් වටිනා ව්‍යාපෘති 07 ක කිසිදු මූල්‍ය හෝ භෞතික ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලබා කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. මෙම තත්ත්වය අධිකාරියේ කළමනාකරණ දුර්වලතාවයක් ලෙස වැඩි දුරටත් නිරීක්ෂණය කරනු ලැබේ. | මූළු ඇස්තමේන්තු ගත පිරිවැය මත අදාළ අනුමැතීන්/නිර්දේශයන් නොලැබීම මත (ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තු නිර්දේශය, කැබිනට් අනුමැතිය) මත ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුනේ අදාළ අනුමැතින් මත ප්‍රතිපාදන ලද මානව සංවර්ධන වැඩසටහන පමණි. 2018.12.31 දිනට මානව සංවර්ධන වැඩසටහන භෞතික ප්‍රගතිය 83% වන අතර මූල්‍ය ප්‍රගතිය රු. මිලි 19.96 ක් විය. | සැලසුම්කළ ව්‍යාපෘතිවල වැඩ කටයුතු අදාළ සැලසුම්වලට අනුව ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තලවකැලේ ලිදුල නිවාස ව්‍යාපෘතිය<br>මෙම නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 100 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 84.5 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ආරම්භ කර 2014 වර්ෂයේ අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ. | | |
| (i) | අවසන් කළ නිවාස 54 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වර්ෂ 04 ක පමණ කාලයක සිට ප්‍රතිලාභීන් වෙත භාරදී නොදීම හේතුවෙන් නිවාසවලට හානි වීම් සිදුවී තිබුණු අතර එම නිවාස නැවත අළුත්වැඩියා සිදු කළ යුතු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | නිවාස 54 න් එක දු නිවසක් හෝ මෙතෙක් නීත්‍යානුකූලව, ගිවිසුම්ගතව ප්‍රතිලාභීන් වෙත බැහැර කර නොමැත. ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් ගත වී නියමානුකුල යතුරු භාර දීම 2019 අගෝස්තු මසට පෙර සිදු කිරීමට නියමිත වේ. | වැඩ අවසන් කළ නිවාස ව්‍යාපෘතිවලට අළුත් නිවාස කඩිනමින් ප්‍රතිලාභීන් හඳුනාගෙන පදිංචිකර වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ව්‍යාපෘතිය මගින් පුනස්ථාපන පදනම මත නිවාස ඒකක 60 ක් ලබා දීමට සැලසුම්කර තිබුණද එයින් නිවාස ඒකක 54 ක් පමණක් ඉදිකර තිබුණි. එහිදී ව්‍යාපෘති අරමුණුවලට පටහැනිව පුනස්ථාපනය කිරීමට අදාළ නොවන පුද්ගලයින් 10 දෙනෙකුට ව්‍යාපෘතිය තුළ නිවාස වෙන් කර දි තිබුණි. | පුනස්ථාපන පදනම මත නිවාස ලබා දුන් 44 දෙනාට අමතරව නගර සභාවේ සභා සම්මුතිය අනුව තවත් නිවාස නොමැති ප්‍රතිලාභීන් 10 දෙනෙකු සඳහා නිවාස ලබා දී ඇත. | සැලසුම් කළ භෞතික ඉලක්ක ලබා කර ගැනීමට කටයුතු කළ යුතු අතර ප්‍රතිලාභීන් නිසි ක්‍රමවේදයකට අනුව හඳුනාගෙන නිවාස පැවරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | මෙම නිවාස ව්‍යාපෘතියට අදාළව ජල සැපයුම ප්‍රමාණවත් නොවන බැවින් අතිරේක ජල සැපයුමක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | ව්‍යාපෘතියට අවශ්‍ය මූලික යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබාදීමට කටයුතු කර ප්‍රතිලාභීන්ට ලැබිය යුතු මූලික පහසුකම් ඉහළ නැංවිය යුතුය. |
| (ආ) | අනුරාධපුර “තුරුඉතුරුගම” නිවාස ව්‍යාපෘතියේ පුනස්ථාපන පදනම මත ලබාදුන් නිවාස ඒකක 12 ක සහ විකුණුම් පදනම මත ලබාදුන් නිවාස ඒකක 09 ක නිවාසලාභීන් සමඟ විකුණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේදී අධිකාරිය විසින් හලාවත නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 57 ක් ඉදිකර ප්‍රතිලාභීන් වෙත ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිවාසලාභීන් 25 දෙනෙකු සමග විකුණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | අතිරේක වාරික සින්න ගිවිසුම් අත්සන් නො කරන ලද සහ වාරික මුදල් නො ගෙවන ලද ප්‍රතිලාභීන් 19 දෙනෙකුට එරෙහිව මේ වන විට අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. හලාවත නාගරික නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් මේ වන විටත් ගිවිසුම් අත්සන් කිරීම සඳහා ඉදිරිපත් වී නොමැති බැවින් ඉදිරියේ දී නඩු පැවරීමට කටයුතු කළ යුතු ව ඇත. | නිවාස ප්‍රතිලාභීන්ට පැවරීමේදී එම ප්‍රතිලාභීන් සමග ගිවිසුම්වලට එළඹිය යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති වටිනාකම රු. බිලියන 13.43 ක් වූ, අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේදි ඉදිකිරීම් ආරම්භ කිරීමට සැළසුම් කළ මහනුවර, මහයියාව නාගරික නිවාස ව්‍යාපෘතියේ වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අරමුදල් සම්පාදනය කර ගැනීමත් සමඟ ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ හැකියාව පවතී. | සැලසුම්කළ ව්‍යාපෘතිවල කටයුතු නියමිත පරිදි ආරම්භ කර, සැලසුම්ගත කාල රාමුවක් අවසන් කළ යුතුය |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් අභුලාන නිවාස ක්‍රමයෙහි පැවැති රු.මිලියන 134.03 ක් වටිනා නිවාස ඒකක 45 ක් මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් බැහැර කර තිබුණද එම කාර්ය 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 26 ප්‍රකාරව සිදු කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිවාස බැහැර කිරීම් ක්‍රමවේදයක් හඳුනාගැනීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි. | එම බැහැර කිරීම් 2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 26 (1) වගන්තිය ප්‍රකාර ව ඔප්පුව ලබා දෙන තෙක් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය පූර්ව ලිඛිත අනුමැතියක් ලෙස දීමනා පත්‍රය සඳහා ලබාගෙන මෙම නිවාස බැහැර කර ඇත. අධිකාරිය විසින් ඉදි කරනු ලබන නිවාස බැහැර කිරීමේ ක්‍රමවේදය සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. කෙටුම්පත් කරන ලද ක්‍රමවේදය නීති කෙටුම්පත් සම්පාදක දක්වා යොමු වී ඇත. | පනතේ විධිවිධානවලට අනුකූලව නිවාස බැහැර කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට හම්බන්තොට නිවාස ණය ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදුන් ණය මුදල රු.3,656,154 ක් වූ අතර එම ණය මුදලට අදාල පොලිය භාණ්ඩාගාරයේ හෝ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත අයනොකිරීමට කටයුතු කර තිබුණි. | මෙම මුදල් අය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය අවධානය ඉදිරියේ දී යොමු කරමි. | ලබාදුන් ව්‍යාපෘති ණය මුදලට අදාළ ණය පොළිය අයනොකිරීම සම්බන්ධයෙන් වන තීරණය රේඛීය අමාත්‍යාංශය මගින් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගනු ලබන අනුමැතිය මත පමණක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභීන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිවාස ව්‍යාපෘති 08 ක් සහ විසිරි නිවාස ණය ලබාදීම වෙනුවෙන් රු.මිලියන 2,082.40 ක් අධිකාරිය වෙත ලබා දී තිබුණි. මෙම මුදල් උපයෝජනය කර විවිධ ව්‍යාපෘති හරහා අඩු ආදායම්ලාභීන් වෙත ලබා දී තිබූ නිවාසවල වටිනාකම සහ විසිරි නිවාස ණය වාරික ප්‍රතිලාභීන්ගෙන් නැවත අයකර ගැනීමට කටයුතු කර තිබුණි.අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී නිවාස ප්‍රතිලාභීන්ගෙන් මෙලෙස අයකර ගත් රු.මිලියන 13.85 ක් වූ ණය වාරික වටිනාකම 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ පනතේ 16 වගන්තිය පරිදි අධිකාරියේ අරමුදලකට බැර නොකර අධිකාරියේ අයභාර වියදම් වෙනුවෙන් වැය කර තිබුණි. | ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති මහල් නිවාස නඩත්තු සහ අලුත්වැඩියා කිරීම් ආදී කටයුතු වෙනුවෙන් මෙසේ එකතු කර ඇති මුදල් පසුගිය වර්ෂයන් හී දී වැය කිරීමට සිදුව ඇත. එහෙත් මෙම තත්වය වළක්වමින් කටයුතු කිරීමට මේ වන විට අවධානය යොමුව තිබේ. | අධිකාරිය එකතු කරනු ලබන ණය වාරික සහ පොළිය පනතේ නියමයන්ට අනුව වෙනම අරමුදලට බැර කළ යුතු අතර ණය වාරික පොළිය අඩු ආදායම් ලාභීන්ගෙන් නැවත අයකර ගැනීමට මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී මානව සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් රු. මිලියන 19.34 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඉන් රු. මිලියන 3.24 ක් ලෝක ජනාවාස දින වැඩසටහන වෙනුවෙන් වියදම් කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම තුල මුදල් ප්‍රවාහ සටහනට අනුව මානව සංවර්ධන වැඩසටහන් සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන අනුව වැය කිරීම් සිදු කර ඇත. | ලෝක ජනාවාස දින වැඩ සටහනට අවශ්‍ය ප්‍රතිපාදන එම වැඩ සටහන් යටතේ ඇස්තමේන්තු කර ලබාගත යුතු අතර වෙනත් කාර්යන් සඳහා ලද මුදල් ඒ සඳහා නොයෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිවාස ව්‍යාපෘති 2 ක ඉදිකිරීම් කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.63,819,532 ක ප්‍රතිපාදන සීමාව ඉක්මවා අධිකාරියේ මුදලින් රු.5,030,899 ක වියදම් කර තිබුණි. | අදහස් දක්වා නොමැත | වියදම් වාර්ෂික ප්‍රතිපාදන සීමාව තුළ දැරිය යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට නිවාස ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් අධිකාරිය ලැබුණු රු. මිලියන 1336.31 ක භාණ්ඩාගාර ප්‍රදාන වලින් රු. මිලියන 38.09 ක් එම අරමුණෙන් බැහැර වෙනත් වියදම් වෙනුවෙන් භාවිතා කර තිබුණි. | අදහස් දක්වා නොමැත | මහා භාණ්ඩාගාර ලබාදෙන ප්‍රදාන, අදාළ අරමුණු සඳහා පමණක් යොදාගත යුතුය. |

### 3.4. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු නිවාස ක්‍රම 05 ක පවතින නිවාස 83 ක් වසර 1 ත් වසර 4 ත් අතර කාලයක් භාවිතයට නොගෙන වසා දමා තිබීම හේතුවෙන් අධිකාරියට රැස්කර ගත හැකිව තිබූ කුලී ආදායම අහිමිවී තිබුණි. | මෙම නිවාස බැහැර කිරීම සඳහා අමාත්‍යවරයාගේ උපදෙස් ඉල්ලා ඇත. තලවකැලේ ව්‍යාපෘතියේ නිවාස 54 ඉදිකිරීම් කටයුතු නිමකරන තෙක් බැහැර කිරීම <u>සිදු කළ නොහැකි වී ඇත</u>. 2019 අගෝස්තු මස වන විට බැහැර කිරීම අවසන් කිරීමට නියමිත වේ. | අධිකාරියට ලබාගත හැකි ආදායම් මනා සැලසුමකට අනුව උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාජ සජීවීකරණ වැඩසටහන යටතේ බෙදා දීම සඳහා 2014 වර්ෂයේදී රු.184,995 කට මිලදී ගත් ජුකී මහන මැෂින් 05 ක් හා 2016 වර්ෂයේදී රු.659,970 කට මිලදී ගත් සාමාන්‍ය මහන මැෂින් 30 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිලාභීන් වෙත ලබාදී නොතිබූ අතර එහි පිරිවැය අවසාන තොගයටද ඇතුළත් කර නොතිබුණි. | මෙම මැෂින් පාලන අංශය සතුව ගබඩා කර ඇත. අවස්ථානුකූල හඳුනා ගන්නා ප්‍රතිලාභීන් වෙත මැෂින් ප්‍රදානය කරනු ලබයි. සාමාන්‍ය මහන මැෂින් 04 ක් පමණක් මේ වන විට ගබඩාවේ පවතින අතර කඩිනම් වැඩපිළිවලක් යටතේ ඉතිරි මැෂින් ප්‍රමාණය ලබා දීමට කටයුතු කරනු ලබයි. | සමාජ සජීවිකරණ වැඩ සටහන යටතේ බෙදා දීම සඳහා මිලදී ගත් උපකරණ කඩිනමින් ප්‍රතිලාභීන්ට ලබාදිය යුතුය. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

-------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 අනුව එක් සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකේම සමාජිකයෙකු නොවිය යුතු වුවද රු.94,300 ක ලිබඩු සහ කාර්යාල උපකරණ මිලට ගැනීමට අදාළ ප්‍රසම්පාදනයේදී එකම සාමාජිකයන් පිරිසක් ලංසු විවෘත කිරීම, ලංසු ඇගයීම හා ප්‍රසම්පාදන කමිටුව නියෝජනය කර තිබුණි. | විෂය සම්බන්ධ දැනුමැති කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන් <u>එකම නිලධාරියෙකු</u> මෙම අවස්ථාවන් දෙකෙහිම කටයුතු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 (ආ) පරිදි, ලංසු ඇගයීමේදී එකතු කළ අගය මත බදු (VAT) සැලකිල්ලට නොගත යුතු වුවද, අධිකාරිය ලංසු ඇගයීමේදි බදු මුදල සමග මිල ඇගයීමට ලක් කර තිබුණි. මෙම තත්ත්වය මත ප්‍රසම්පාදන කටයුතුවලදී බදු සඳහා ලියාපදිංචි නොවූ ලංසුකරුවන්ට වාසිකදායක වන අයුරින් අධිකාරිය කටයුතු කර තිබුණි. | ඉදිරියේ දී සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන් වල ලන්සු ඇගයීමේ කාර්යය සිදු කිරීමේදී මේ සම්බන්ධයෙන් පූර්ණ අවධානය යොමු කර සිදුකරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හලාවත නිවාස ව්‍යාපෘතියේ කාණු පද්ධතිය සැකසීමට 2015 වර්ෂයේදි රු.මිලියන 2.86 ක් අධිකාරියට ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ඉටු කර නොතිබුණු අතර කිසිදු භෞතික ප්‍රගතියක් අත්කරගෙනද නොතිබුණි. | හලාවත කාණු පද්ධතිය ඉදිකිරීම වත්මන් අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි නව සැලසුමක් සකස් කරනු ලබන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉදිකිරීම් කටයුතු <u>ආරම්භ කිරීමට බලාපොරොත්තු</u> වේ. | වාර්ෂික ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති අදාළ වර්ෂය සැසදීම කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | අගුලාන සයුරුපුර නිවාස ව්‍යාපෘතියේ වෙළද සංකීර්ණය සහ කසළ බැහැරකරන ස්ථානය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් ගත කාලය 2016 සැප්තැම්බර් 27 දින වන විට අවසන්ව තිබූ නමුත් 2019 මැයි වන විටත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමටකටයුතු කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද රු. 2,803,447 අත්තිකාරම් මුදල් පියවා ගැනීමටද අධිකාරිය අපොහොසත්ව තිබුණි. | අදහස් දක්වා නොමැත. | වාර්ෂික ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති, අදාළ වර්ෂය තුළදීම කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | ලුනාව නිවාස ව්‍යාපෘතිය ඉකුත් වර්ෂයේදි රු. මිලියන 90 ක් වැයකොට සම්පූර්ණයෙන්ම නිම කිරීමට සැළසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබීම හේතුවෙන් එම නිවාස ප්‍රතිලාභීන්ට ලබා දීම ප්‍රමාද වී තිබුණි. | ලුනාව ව්‍යාපෘතිය සඳහා නව අංග එක් වීම මත හා විෂය පථය පුළුල් වීම මත රු. මිලි 143.141 අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අදාළ අනුමැතීන් මත අදාළ අතිරේක වැඩ කොටස් අවසන් කර ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කිරීමේ <u>හැකියාව පවතී</u>. | මහා භාණ්ඩාගාර ප්‍රදාන මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කාර්යන් සැලසුම් කළ කාලය තුළ නිම කිරීමට පියවර ගත යුතුය. |

## 3.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත නිලධාරීන් සිව් දෙනෙකු මුදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදි අධිකාරිය විසින් ඔවුන්ට වැටුප් ලෙස රු.386,043 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රතිපූර්ණය කර ගත යුතු මුදල රු.45,567 ක් විය. | මේ වන විට අධිකාරියේ සේවයෙන් වෙනත් ආයතන වෙත මුදා හැර ඇති සේවක සංඛ්‍යාව එක අයෙකු පමණක් වේ. | අධිකාරියට ලැබියුතු මුදල් කඩිනමින් ප්‍රතිපූර්ණය කර ගත යුතුය |

## 3.8 කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 158 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 142 ක් වීමෙන් අධිකාරියේ කාර්ය මණ්ඩලයේ 41 ක පුරප්පාඩු හා අතිරික්ත 22 ක් විය. | පුරප්පාඩු ද ඉදිරියේදි බඳවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. එමෙන්ම අතිරික්ත තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියට යොමු කර ඇත. | මහා භාණ්ඩාගාරය අනුමත කරන ලද කාර්ය මණ්ඩලය කඩිනමින් බඳවාගත යුතුය |
| (ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව නිලධාරීන් 22 දෙනෙකු අධිකාරියට බඳවාගෙන තිබුණද එම තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | අදාල තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කරන ලද අතර වරින් වර ඒ සම්බන්ධයෙන් ලිපි යොමු කර ඇත. | තාවකාලිකව බඳවා ගන්නා නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර එය සංශෝධනය කළ යුතුය |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතට අනුව ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | | |
| (අ) රජය හා පළාත්පාලන ආයතන සතු ඉඩම් අධිකාරියේ කටයුතු වෙනුවෙන් අත්පත් කර ගැනීම. | 2020-2022 කාල සීමාව සඳහා සංශෝධනය වන සංයුක්ත සැලැස්ම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය හා අත්පත් කර ගනු ලැබූ ඉඩම් පිළිබඳ ව ඇතුළත් කිරීමට සැලසුම් කර ඇත. | පනතේ සඳහන් ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කළ යුතුය |

| | | |
|---|---|---|
| (ආ) නාගරික පදිංචිකරුවන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය හඳුනාගැනීමට අදාල වන සමීක්ෂණ හා අධ්‍යනය කටයුතු පැවැත්වීම. | ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සඳහා දීප ව්‍යාප්තව සමාජ ආර්ථික සමීක්ෂණයක් සිදු කිරීම සඳහා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත. | පනතේ සඳහන් ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කළ යුතුය |
| (ඇ) ජාතික වශයෙන් අදාලවන නාගරික නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. | දිරිය නාගරික නිවාස වැඩසටහන හරහා නිවාස ණය යෝජනා ක්‍රමයක් 2012 වර්ෂයේ සිට සැලසුම් කිරීම හා අදාළ අනුමැතිත් මත ක්‍රියාත්මක කිරීම සිදු වේ. | පනතේ සඳහන් ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කළ යුතුය |

## 4.2 ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රදාන මත ඉටුකළ යුතු ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාකාරී සැලසුම තුළ ඇතුළත් කර තිබුණු අතර අධිකාරියේ ඉපයීම් මත ඉටුකරන ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර ඉපැයීම් මත ව්‍යාපෘති හඳුනා ගැනීමක් සිදු නොවුණි. | වර්ෂය තුළ ඉටුකිරීමට අපේක්ෂිත සියලුම ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලස්මට ඇතුළත් කළ යුතුය. |

## 4.3 අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය තුළ විගණන අංශය වෙනුවෙන් අභ්‍යන්තර විගණක තනතුර පමණක් අනුමත කර තිබුණු අතර මේ පිළිබඳව පසුගිය විගණකාධිපති වාර්තාවලින්ද පෙන්වාදී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළ හෝ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම අංශයට කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය තුල විගණන අංශය වෙනුවෙන් අභ්‍යන්තර විගණන තනතුර පමණක් අනුමත කර ඇති බැවින් විගණන අංශය ශක්තිමත් කිරීම සඳහා යෝජනා පාලන අංශය වෙත ලබා දී ඇති අතර තවමත් ඒ සඳහා විසඳුම් ඉදිරිපත් වී නොමැත. | අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත්ව පවත්වා ගත යුතුය. |

### 4.4 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් සඵලදායී පාලන උපක්‍රමයක් ලෙස අයවැය භාවිතා කර නොතිබුණු අතර අයවැය ගත කරන ලද වියදම සත්‍ය වියදම සමඟ සැසඳීමේදී සියයට 25 සිට සියයට 395 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | වාර්ෂික අයවැය වෙන් කිරීම තුල කටයුතු කළමනාකරණය කර ගැනීම කෙරෙහි මේ වන විට <u>අධිකාරියේ විශේෂ අවධානය</u> යොමුව පවතී. | අයවැය ලේඛනය සඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදා ගත යුතුය. |

### 4.5 තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු ආකාරය, ඉලක්ක මැණ බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනා ගෙන නොතිබුණි. | භෞතික මානව සංවර්ධන වැඩසටහන හරහා නිවාස විසඳුම් ලබා දීම හා මානව සංවර්ධන වැඩසටහන හරහා ඉලක්ක ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හරහා තිරසාර සංවර්ධන අරමුණු 10ක් (සංයුක්ත සැලැස්ම 2017-2019) වෙත අවධානය යොමු කර ඇත. | එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රය අනුව තිරසර සංවර්ධන ඉලක්ක කඩිනමින් හඳුනා ගත යුතුය. |